ඔබ අතරින් වඩාත් ශේර්ෂ්ටතම උදවිය මාගේ යුගයේ උදවියයි. අනතුරුව ඔවුනට පරව සිටින්නෝ වෙති. පසුව ඔවුනට පරව සිටින්නෝ වෙති

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව ඉම්රාන් ඉබ්නු හුසෙයින් (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: "ඔබ අතරින් වඩාත් ශේර්ෂ්ටතම උදවිය මාගේ යුගයේ උදවියයි. අනතුරුව ඔවුනට පරව සිටින්නෝ වෙති. පසුව ඔවුනට පරව සිටින්නෝ වෙති" ඉම්රාන් තුමා මෙසේ පවසයි: නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ඉන්පසු පවසා සිටියේ යුග දෙකක් ද තුනක් ද යන්න ගැන තමන්ට මතක නැති
බව ය. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මෙසේ පැවසූහ: සැබැවින්ම ඔබ අතරින් වඩාත් දුරස්ත පිරිසක් ද වෙති. ඔවුහු වංචා කරති; ඔවුන්ව විශ්වාස කළ නොහැක. සාක්ෂි
දරති; ඔවුන්ගෙන් සාක්ෂි දෙන මෙන් ඉල්ලා නැත. ඔවුන් භාර වෙති; එය ඉටු කරන්නේ නැත.
ඔවුන් අතර තරබාරුකම දිස්වනු ඇත." [صحيح] [متفق عليه]

එකම යුගයක එකිනෙකා මුණ ගැසෙන මිනිසුන් අතරින් ශේර්ෂ්ඨතම අය වනුයේ අල්ලාහ්ගේ දූතයාණන් හා එතුමාණන්ගේ සහගාමීන් ජීවත් වූ යුගය බවත් ඔවුනට පසුව අල්ලාහ්ගේ දූතයාණන් හමු නොවුණ ද සෙසු සහාබාවරුන් හමු වූ යුගයේ අය බවත් පසුව එම අනුගාමකියන් අනුගමනය කළ යුගයේ අය බවත් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ දන්වා සිටියහ. ඉන් පසු ඔවුනට පසුව එන සිව් වැනි යුගය ගැන සඳහන් කිරීමේ දී එම සහාබිවරයා පසුබට වී ඇත. පසුව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් මෙසේ ප්රකාශ කළහ: ඔවුන් අතරින් පිරිසක් වෙති. ඔවුන් වංචා කරති. ඔවුන් ගැන මිනිසුන්ට විශ්වාස කළ නොහැක. ඔවුන්ගෙන් සාක්ෂියට පෙනී සිටින මෙන් ඉල්ලා සිටීමට පෙර ඔවුන් සාක්ෂි දෙති. ඔවුන් භාර වෙති. නමුත් එය ඔවුන් ඉටු නොකරති. ඔවුන් තුළ තරබාරුකම පෙනෙන තරමට ආහාර පාන විශාල වශයෙන් ගනිති.

https://sunnah.global/hadeeth/si/show/66370